32 S II

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022

## උපකාරක ප්‍රශ්න පත්‍ර

විෂයය - ව්‍යාපාර අධ්‍යයනය | පත්‍රය - II | කාලය : පැය 03

උපදෙස්:-

- I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න දෙකක් ද ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

22 A/L අපි [ papers group ]

### I කොටස

1. K.D.P. තේ කර්මාන්ත ශාලාව ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන්ගෙන් තේ දළු මිලට ගෙන තේ කුඩු නිෂ්පාදනය කරයි. කර්මාන්ත ශාලාවේ සේවකයන් 45ක් සේවය කරයි. වඩාත් ප්‍රමිතියෙන් යුතු තේ නිෂ්පාදනය කිරීම සඳහා මෙම වර්ෂය තුළ ජපානයෙන් නව යන්ත්‍රයක්ද මිලට ගන්නා ලදී. K.D.P. තේ ප්‍රධාන වශයෙන් විදේශ වෙළඳපළට අලෙවි කරයි. කර්මාන්තශාලාවේ පිවිසුම් දොරටුව අසල තේ අලෙවි කුටියක් පවත්වාගෙන යන අතර, කුඩා ලොරි රථයක් මගින් ප්‍රදේශයේ සති පොළවල් වලද තේ පැකට් අලෙවි කරයි. එසේම ප්‍රදේශයේ හෝටල් විසින්ද K.D.P. තේ පැකට් මිලට ගනු ලබයි.

   මෙම ව්‍යාපාරය විසින් සිංහල අලුත් අවුරුද්ද නිමිත්තෙන් සේවකයන්ටද, වෙසක් පොහොය දිනයේදී ප්‍රදේශයේ දිළිඳු ජනතාවටද, වියළි ආහාර ද්‍රව්‍ය පාර්සල් බෙදා දීම වාර්ෂිකව සිදු කරනු ලබයි. එසේම රජයට බදු මුදලක්ද ගෙවයි.

   i. අ. අවශ්‍යතා හා වුවමනා නිර්වචනය කර ඉහත ව්‍යාපාරය ඇසුරින් නිදසුන් සපයන්න. (ලකුණු 02)

   ආ. කර්මාන්ත මූලය අනුව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී K.D.P. තේ කර්මාන්ත ශාලාව අයත් වන්නේ කුමන අංශයටද? (ලකුණු 02)

   ii. අ. මෙම ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව දෙකක් නම් කර, එම පාර්ශ්ව ව්‍යාපාරයට වැදගත් වීමට හේතුව බැගින් දක්වන්න. (ලකුණු 02)

   ආ. රසායනික පොහොර ආනයනය නතර කිරීමේ රජයේ තීරණය කුමන ව්‍යාපාර පරිසරයකට අයත්දැයි සඳහන් කර, එය මෙම ව්‍යාපාරය කෙරෙහි බලපාන ආකාරය සඳහන් කරන්න. (ලකුණු 02)

   iii. අ. මෙම ව්‍යාපාරය විසින් සිදු කරනු ලබන සමාජ වගකීම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

   ආ. කුඩා ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ විවිධ ආයතන විවිධ නිර්ණායක භාවිත කරයි. සේවක සංඛ්‍යාව අනුව වර්ග කිරීමේදී,

   1. "සුළු හා මධ්‍ය පරිමාණ" ව්‍යාපාරයක් ලෙස වර්ග කරන්නේ කුමන ආයතනද? (ලකුණු 01)
   2. "මහා පරිමාණ" ව්‍යාපාරයක් ලෙස වර්ග කරන්නේ කුමන ආයතනද? (ලකුණු 01)

   iv. අ. 'මෙම ව්‍යාපාරය වක්‍ර නිෂ්පාදනයේ නිරත වේ' මෙම ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේද? පැහැදිලි කරන්න. (ලකුණු 02)

   ආ. වෙළඳාමේ ප්‍රභේද ගැලීම් සටහනක් මගින් දක්වා මෙම ව්‍යාපාරය ඇසුරින් නිදසුන් සපයන්න. (ලකුණු 02)

   v. K.D.P. තේ කර්මාන්ත ශාලාව රටේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ආකාර හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

2. රට තුළ පවතින ගෑස් අර්බුදය හමුවේ විනී සහ බොනී තමන්ගේ නිවෙස් වලට අවශ්‍ය ගෑස් නිපදවා ගැනීමට යොමු වුයේය. ඒ සඳහා ඔවුන් ගොම සහ ඉවත දමන අපද්‍රව්‍ය භාවිතයෙන් බයෝ ගෑස් (bio gas) නිෂ්පාදනයට යොමු විය.

ඉන්පසු ඔවුන් එම බයෝ ගෑස් ටැංකි වල ගබඩා කර තම අසල්වැසි නිවෙස් වලට අලෙවි කළේය. ගෑස් හිඟය නිසා ව්‍යාපාරය ඉක්මනින් දියුණු වූ අතර සේවකයන් කිහිප දෙනෙක් බඳවා ගෙන වගකීම සීමිත ව්‍යාපාර සංවිධානයක් ලෙස ලියාපදිංචි කිරීමට අදහස් කළේය.

එම ව්‍යාපාරයේ අලෙවි කටයුතු පහසුකර ගැනීම සඳහා සී/ස කහඳගම (පෞද්) සමාගම සමඟ ගිවිසුමක් අත්සන් කළ අතර, එහිදී නව නිෂ්පාදන සීමිත ප්‍රදේශයක් තුළ අලෙවි කිරීමට කහඳගම සමාගමට අවසර හිමි විය.

i. අ. අයිතිකරුවන්ගේ වගකීම සීමිත වන ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කිරීමට සුදුසු ව්‍යාපාර සංවිධාන වර්ගයක් යෝජනා කරන්න. (ලකුණු 01)

ආ. ඉහත (අ)හි දක්වන ලද ව්‍යාපාර සංවිධාන වර්ගයෙහි වාසි හා අවාසි තුන බැගින් සඳහන් කරන්න. (ලකුණු 03)

ii අ. ඉහත (අ)හි සඳහන් ව්‍යාපාර සංවිධාන වර්ගයට සුදුසු නමක් යෝජනා කර, නමක් තීරණය කිරීමේදී විශේෂ අවධානයක් යොමු කළයුතු කරුණක් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ. ඔබ යෝජනා කරන ලද ව්‍යාපාර සංවිධාන වර්ගය ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ලියකියවිලි නම් කරන්න. (ලකුණු 02)

iii. අ. සී/ස කහඳගම (පෞද්) සමාගම සමඟ ගිවිසුම්ගත වීම තුළින් ඇතිවන ව්‍යාපාර ක්‍රමයට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව දෙක නිදසුන් සහිතව දක්වන්න. (ලකුණු 02)

ආ. විනී සහ බොනී විසින් පවත්වාගෙන යන ව්‍යාපාරය විසින් සී/ස කහඳගම (පෞද්) සමාගමට ලබාදෙන පහසුකම් දෙකක් දක්වන්න. (ලකුණු 02)

iv. පවතින රජයන් රටේ ව්‍යාපාර කටයුතු වලට මැදිහත් නොවීමෙන් එරට ජනතාවට අහිතකර ප්‍රතිවිපාක වලට මුහුණ සිදුවේ.

අ. එසේ රජයන් ව්‍යාපාර කටයුතු වලට මැදිහත් නොවීමෙන් ජනතාවට මුහුණ පෑමට සිදුවිය හැකි අහිතකර ප්‍රතිවිපාක මොනවාද? (ලකුණු 02)

ආ. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී භාවිත කරන මූල්‍ය උපකරණ දෙකක් නම් කර, ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 02)

v. අ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තැන්පතු හා ණය සඳහා වන පොලී අනුපාත ඉහළ දැමීමෙන් අපේක්ෂා කරන අරමුණු මොනවාද? (ලකුණු 02)

ආ. දේශීය සබන් නිෂ්පාදකයෙකුට තම නිෂ්පාදිතයේ අලෙවිය වර්ධනය කරගැනීමට යොදාගත හැකි උපක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

3. i. අ. සෑම අවධානමක්ම රක්ෂණය කළ නොහැකිය, එසේ නම් රක්ෂණය කළ හැකි අවධානම් වල තිබිය යුතු ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ. ගිනි රක්ෂණය පැහැදිලි කර, එම ආවරණය යටතේ ගිනි හානි වලට අමතරව ආවරණය කළ හැකි අවධානම් දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. අ. මුදල් මඟින් ගනුදෙනු ක්‍රියාවලිය පහසු කරයි. හොඳ මුදලක ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 02)

ආ. මුදලේ කාර්යයන් දෙකක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 02)

iii. අ. ධාරක චෙක්පත් හා විධාන චෙක්පත අතර සැසඳීමක් කරන්න. (ලකුණු 02)

ආ. කොටස් වෙළඳපොළ තුළ තැරැව්කාර සමාගම් ඉමහත් කාර්යයක් සිදු කරයි. කොටස් තැරැව්කාර සමාගමක කාර්යයන් හතරක් විස්තර කරන්න. (ලකුණු 02)

iv. අ. විද්‍යුත් මුදලින් ගනුදෙනු කිරීමේ වාසි දෙකක් හා අවාසි දෙකක් දක්වන්න. (ලකුණු 02)

ආ. ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හතරක් දක්වන්න. (ලකුණු 02)

v. වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණ පා ඇති ආර්ථික අර්බුධකාරී තත්වය, ව්‍යවසායකයන් ශක්තිමත් කිරීම තුළින් මගහරවා ගත හැකි වුවද ව්‍යවසායකයන් බිහිවන්නේ ඉතා සුළු වශයෙනි. ඊට හේතු හතරක් දක්වමින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

4. i. පාසල් සංවර්ධන සමිති විශේෂ මහ සභා රැස්වීමේ සන්නිවේදන කටයුතු සිදු කිරීමට එහි ලේකම්ධූරය දරන මා හට පැවරී තිබුණි. නමුත් එහිදී සන්නිවේදන කටයුතු වල ඇති වූ බාධාකාරී තත්වය නිසා රැස්වීම පසු දිනට කල් තබන්නට විය.

අ. සන්නිවේදන කටයුතු කරගෙන යාමේදී මා හට මුහුණ පෑමට සිදුවූ සන්නිවේදන බාධා කවරේදැයි ඔබ සිතන්නේද? එසේ සිදුවිය හැකි බාධා හතරක් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ. එම බාධා අවම කරගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග හතරක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. අ. මහල් කිහිපයකින් යුතු ව්‍යාපාර ආයතනයක කළමනාකරුවෙකු ලෙස සේවය කරන ඔබට අභ්‍යන්තර සන්නිවේදන කටයුතු සඳහා යොදා ගත හැකි වඩාත් යෝග්‍ය සන්නිවේදන ක්‍රමය කුමක්ද? ඔබ එය තෝරා ගැනීමට හේතුවූ කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ. රටපුරා ප්‍රාදේශීය වශයෙන් ඛණිජ තෙල් බෙදා හැරීම සඳහා උපයෝගී කරගන්නා ප්‍රවාහන පද්ධතියේ මූලිකාංග නිදසුන් සහිතව දක්වන්න. (ලකුණු 02)

iii. අ. ප්‍රවාහන කටයුතු කාර්යක්ෂම ලෙස සිදු කරගෙන යාම සඳහා වර්තමානයේ යොදාගෙන ඇති නවීන ක්‍රම සඳහන් කරන්න. (ලකුණු 02)

ආ.ව්‍යාපාරිකයෙකුට ප්‍රවාහන හා සැපයුම් සේවා වලින් ඇති ප්‍රයෝජන කවරේද? යන්න කරුණු හතරකින් දක්වන්න. (ලකුණු 02)

iv. අ. ව්‍යාපාරිකයෙකු විදේශීය රටකින් භාණ්ඩ ගෙන්වීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය සඳහන් කරන්න. (ලකුණු 02)

ආ. ' සනීපාරක්ෂක සහතිකයක්' නිකුත් කිරීමේ අවශ්‍යතාව කවරේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

v. අ. විදේශ ගැනුම්කරුවෙකු සොයාගැනීමට තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර හතරක් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ. අන්තරාල වෙළඳාමට වඩා ප්‍රතිඅපනයන වෙළඳාම ශ්‍රී ලංකාවට වැදගත් වීමට හේතුවන කරුණු හතරක් දක්වන්න. (ලකුණු 02)

22 A/L අපි [ papers group ]

## II කොටස

5. i. අ. සංවිධානවල පරමාර්ථ හා අරමුණු සාධනය සඳහා කළමනාකරණය බලපාන ආකාර හතරක් දක්වන්න. (ලකුණු 02)

ආ. හෙන්රි මින්ස්බර්ගේ කළමනාකරණ භූමිකාවල ආයතන ප්‍රධානියා සහ බාධා පාලනය කරන්නා යන උප භූමිකාවලට අයත් කාර්ය විස්තර කරන්න. (ලකුණු 02)

ii. අ. සැලසුම්කරණ ක්‍රියාවලියේදී පරිසර විශ්ලේෂණය තුලින් ඇති ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ. සංවිධානකරණයේදී "නියෝගදීමේ දාමය හා අණ කිරීමේ ඒකීයතාව" යන සංකල්ප අතර වෙනස දක්වන්න. (ලකුණු 02)

iii. අ. මෙහෙයවීමේ ක්‍රියාවලියේ ප්‍රධාන කාර්යයන් තුන සඳහන් කර ඒ එක් එක් කාර්යයේ අවශ්‍යතාව සඳහන් කරන්න. (ලකුණු 03)

ආ. පාලන ශිල්ප ක්‍රම දෙකක් සඳහා වන නිදසුන් පහත දැක්වේ. එම එක් එක් නිදසුන සඳහා වන පාලන ශිල්පීය ක්‍රමය දක්වන්න.

1. සේවකයන් පුහුණු කිරීම මගින් ප්‍රවීනයන් බවට පත් කිරීම
2. තොග පාලනය (ලකුණු 01)

iv. අ. මෙහෙයුම් කළමණාකරණයට අයත් කාර්යයන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ. භාණ්ඩ නිෂ්පාදන ආයතන දෙකකට නිදසුන් පහත දැක්වේ

1. මනාලියන්ට ඇඳුම් මැසීම
2. සිසිල් බීම නිශ්පාදනය

නිෂ්පාදන ආයතන විසින් නිෂ්පාදනය සිදු කරනු ලබන ආකාරය අනුව ඉහත නිෂ්පාදනයන්ට අදාළ නිෂ්පාදන ක්‍රම සඳහන් කර ඒ එකිනෙකෙහි හිතකර ලක්ෂණය බැගින් සඳහන් කරන්න (ලකුණු 02)

v. තොග පාලන ක්‍රම හතරක් නම් කර, ඉන් එක් ක්‍රමයක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

6. i. අ. ශ්‍රම ඵලදායීතාව ගණනය කරන ආකාරය දක්වා ව්‍යාපාර ආයතනයකට ශ්‍රම ඵලදායීතාවය වර්ධනය කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ. මහා පරිමාණ නිෂ්පාදන ආයතන වල මෙහෙයුම් කළමණාකරණ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කර ගැනීමට යොදා ගත හැකි නව නිෂ්පාදන ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. තොග සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

අවම ද්‍රව්‍ය පරිභෝජනය දිනකට ඒකක 30
උපරිම ද්‍රව්‍ය පරිභෝජනය දිනකට ඒකක 50
යලි ඇණවුම් කාලය අවමය දින 10 උපරිමය දින 50
යලි ඇණවුම් ප්‍රමාණය ඒකක 3000

ගණනය කරන්න.

1. යලි ඇණවුම් මට්ටම
2. උපරිම තොග මට්ටම
3. අවම තොග මට්ටම
4. සාමාන්‍ය ද්‍රව්‍ය පරිභෝජනය (ලකුණු 04)

22 A/L අපි [ papers g

iii "විෂම ගති ලක්ෂණ වලින් යුක්ත සමස්ථ වෙළඳපොළ සමජාතීය ලක්ෂණ වලින් යුත් කණ්ඩායම් වලට බෙදා වෙන් කිරීම වෙළෙඳපොළ ඛණ්ඩනය ලෙස හඳුන්වයි"

අ. පාරිභෝගික වෙළඳපොළ ඛණ්ඩනයට යොදා ගන්නා පදනම් හතර නම් කරන්න. (ලකුණු 02)

ආ. එසේ වෙළඳපොළ ඛණ්ඩනය කිරීම තුලින් ව්‍යාපාරිකයාට ලැබෙන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

iv. අ. යෝග්‍ය බෙදා හැරීමේ මාර්ගයක් තෝරා ගැනීමේදී ව්‍යාපාරිකයෙකු විසින් සැලකිය යුතු ප්‍රධාන සාධක හතරක් නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 04)

v. රට තුල පවත්නා ආර්ථික අර්බුදය හමුවේ කොළඹ කොටස් වෙළඳපොළ මිල දර්ශක පහළ අගයන් පෙන්නුම් කරයි.

අ. කොළඹ කොටස් හුවමාරුව ශ්‍රී ලංකා ආර්ථිකයට වැදගත් වෙන ආකාර හතරක් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ. කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනු වන සුරැකුම්පත් වර්ග හතරක් නම් කරන්න. (ලකුණු 02)

7. i. අ. පත්වීම් ලිපියක ඇතුලත් කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ. රැකියා විස්තරය හා පිරිවිතරය අතර වෙනස්කම් දෙක බැගින් දක්වන්න. (ලකුණු 02)

ii. අ. සේවක දුක්ගැනවිලි විසඳීම සඳහා අනුගමනය කළයුතු පියවර හතරක් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ. සිතිජ කළමනාකරණ සහකරුවෙකු ලෙස සේවකයින් පුහුණු කිරීමේ ආයතනයක සේවය කරයි. ඔහු ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් සෑම දිනකම ප්‍රමාද වී පැමිණේ. ආයතනයේ කළමනාකරු හට ගත හැකි විනය ක්‍රියාමාර්ග හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

iii. ව්‍යාපාරයක අනාගත පැවැත්ම හා තීරණ සඳහා මානව සම්පත් සැලසුම්කරණය ඉතා වැදගත් වේ. මානව සම්පත් සැලසුම්කරණ ක්‍රියාවලියේ පියවර සඳහන් කරන්න. (ලකුණු 04)

iv. ව්‍යාපාරයක සාර්ථකත්වයට මහ බැංකුව සපයනු ලබන මූල්‍ය යටිතල පහසුකම් යන්න පැහැදිලි කර, ඊට උදාහරණ දෙකක් සපයන්න. (ලකුණු 04)

v. සී/ස නවෝද්‍යා සමාගමේ වෙළඳ ගිණුමෙන් උපුටාගත් දත්ත කිහිපයක් පහත දැක්වේ.

| | රු. | රු. |
|---|---|---|
| විකුණුම් | | 1000,000 |
| ආරම්භක තොගය | 100 000 | |
| ගැණුම් | 600 000 | |
| | 700 000 | |
| (-)අග තොගය | (220 000) | 480 000 |

පහත දෑ වලට පිලිතුරු සපයන්න.

1. දළ ලාභය
2. දළ ලාභ අනුපාතය
3. සාමාන්‍ය තොගය
4. තොග පිරිවැටුම් අනුපාතය (ලකුණු 04)

8. i. අ. පරිගණක ගත කරන ලද තොරතුරු පද්ධතියක ඇතුලත් වන උපාංග හතරක් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ. පහත සඳහන් තොරතුරු පද්ධති උපයෝගී කරගෙන ව්‍යාපාර ආයතනයක් තුළ සිදු කරන කාර්යයන් දෙක බැගින් දක්වන්න.

★ මෙහෙයුම් කළමනාකරණ තොරතුරු පද්ධති
★ අලෙවිකරණ තොරතුරු පද්ධති (ලකුණු 02)

ii. අ. 'ව්‍යාපාර ආයතනයකට තොරතුරු පද්ධති අවශ්‍ය වන්නේ කළමනාකාරිත්වයට අදාළ තීරණ ගැනීම සඳහා පමණි.' මෙම ප්‍රකාශය කෙරෙහි ඔබේ අදහස දක්වන්න. (ලකුණු 02)

ආ. 'තොරතුරු තාක්ෂණය බද්ධ වී ඇත්තේ ක්ෂේත්‍ර තුනක් පදනම් කොටගෙනය.' මෙහි තොරතුරු තාක්ෂණය යන්න කෙටියෙන් හඳුන්වා එයට අදාල ක්ෂේත්‍ර තුන නම් කරන්න. (ලකුණු 02)

iii. අ. ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර සිදු කළ යුතු මෙහෙයුම් කාර්යයන් හා වියදම් හතරක් දක්වන්න. (ලකුණු 02)

ආ. මෙහෙයුම් සැලැස්මක් සාර්ථක වීම සඳහා තිබිය යුතු අංග හතරක් දක්වන්න. (ලකුණු 02)

iv. ව්‍යාපාරයක් ආරම්භ කිරීමට කටයුතු කරමින් සිටි කමල්ට ඔහුගේ මිතුරකු වූ අමල් පෙන්වා දී තිබුණේ ව්‍යාපාර සැලැස්මක් නිර්මාණය කිරීම දුෂ්කර කටයුත්තක් බවත් ඊට කාලය හා මුදල් වෙන් කිරීම ඵල රහිත බවත්ය. අමල්ගේ මෙම යෝජනාව නිසා අළුතින් ආරම්භ කරන මෙම ව්‍යාපාරය සම්බන්ධයෙන් ඇතිවිය හැකි ගැටලු හතරක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

v. අ. මානව සම්පත් සැලැස්මක අන්තර්ගත විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ. ව්‍යාපාරිකයෙකුට මානව සම්පත් සැලැස්මක් පිළියෙල කිරීමේ වැදගත්කම කරුණු හතරක් ඇසුරින් දක්වන්න. (ලකුණු 02)

22 A/L අපි [ papers group ]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

32 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022

# උපකාරක ප්‍රශ්න පත්‍ර

විෂයය - ව්‍යාපාර අධ්‍යයනය | පත්‍රය - I | කාලය : පැය 02

උපදෙස්:-

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 30 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉර මත ලියන්න.

01. ව්‍යාපාර විකාශනය සම්බන්ධයෙන් දී ඇති වැදගත් අවස්ථා අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

A - වෙළඳාම | D - කාර්මික විප්ලවය
B - මුදල් භාවිතය | E- විද්‍යුත් ව්‍යාපාර
C - භාණ්ඩ හුවමාරුව | F- විද්‍යුත් වෙළඳාම

1. A,B,C,D,E,F  2. C,A,B,D,F,E  3. B,A,D,C,F,E
4. D,B,C,A,E,F  5. C,A,D,B,E,F  (.........)

22 A/L අපි [ papers gro

02. පහත දැක්වෙන්නේ විවිධ පාර්ශව ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට හේතු කිහිපයකි.

A. ප්‍රාග්ධනයේ සුරක්ෂිතභාවය | C. ණය වල සුරක්ෂිතභාවය
B. තනතුරේ වර්ධනය | D. ප්‍රසාද දීමනා

මෙම හේතු අදාළ වන එක් එක් පාර්ශවයන් වන්නේ පිළිවෙලින්,

1. සේවකයන් /අයිතිකරුවන් /කළමනාකරුවන් /ණය හිමියන්
2. අයිතිකරුවන් /සේවකයන් /ණය හිමියන් /කළමනාකරුවන්
3. කළමනාකරුවන් /ණය හිමියන් /අයිතිකරුවන් /සේවකයන්
4. අයිතිකරුවන් /ණය හිමියන් /කළමනාකරුවන් /සේවකයන්
5. අයිතිකරුවන් /ණය හිමියන් /සේවකයන් /කළමනාකරුවන්  (.........)

03. තිරසර සංවර්ධන සංකල්ප සහ ඒවා තහවුරු කිරීමට ගත හැකි ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

| තිරසර සංකල්ප | ක්‍රියාකාරකම් |
|---|---|
| A- ආර්ථික තිරසර සංවර්ධනය | 1. නීතිය හා සාමය සුරැකීමට දායක වීම. |
| B- පරිසර තිරසර ආරක්ෂණය | 2. පරිසර හිතකාමී ප්‍රවාහන ක්‍රම භාවිතය |
| C- සමාජ තිරසර සංවර්ධනය | 3. නිෂ්පාදන ක්‍රියාවලිය දිරිගැන්වීම. |
| | 4. නවෝත්පාදන හඳුන්වාදීම. |
| | 5. අන්තරාකාරී ද්‍රව්‍ය සුරක්ෂිතව භාවිතා කිරීම. |
| | 6. මානව අයිතිවාසිකම් සුරැකීමට දායක වීම. |

22 A/L අපි [ papers group ]


ඉහත තිරසර සංකල්පවලට අදාළ ක්‍රියාකාරකම් වනුයේ,

1. A-3,4 B-2,5 C-1,6
2. A-2,5 B-3,4 C-1,6
3. A-1,5 B-2,6 C-3,4
4. A-3,4 B-3,4 C-5,6 (.........)
5. A-3,6 B-2,5 C-1,4

04. හවුල් ව්‍යාපාර නිර්වචනයට අනුව හවුල් ව්‍යාපාරයක අනිවාර්යය ලක්ෂණ සහ හවුල් ව්‍යාපාරයක වාසි කිහිපයක් පහත දැක්වේ.

A - ලාභ ලැබීමේ අරමුණින් තිබීම.
B - ව්‍යාපාර කටයුත්තක් පැවතීම.
C - වැඩි ප්‍රාග්ධනයක් රැස් කරගත හැකි වීම.
D - වගකීම කිහිප දෙනෙකු අතර බෙදී යාම.
E - පුද්ගලයන් සමූහයක් සිටීම.
F - හවුල්කරුවන් අතර එකඟතාවයක් තිබීම.

හවුල් ව්‍යාපාරයක අනිවාර්යය ලක්ෂණ පමණක් ඇතුලත් පිළිතුර වනුයේ,

1. A,B,C,D
2. B,C,D,E
3. A,C,D,E,
4. A,B,E,F
5. C,D,E,F (.........)

05. වරලත් ව්‍යාපාර සහ ඒවාට අදාළ නිදසුන් පහත දැක්වේ

| ව්‍යාපාර වර්ගය | නිදසුන් |
|---|---|
| A- නිෂ්පාදිත වරලත් ව්‍යාපාර | 1. කොකාකෝලා නියෝජිත ආයතනය |
| B- නිෂ්පාදන වරලත් ව්‍යාපාර | 2. මැක්ඩොනල්ඩ් ආයතනය |
| C- ව්‍යාපාර ක්‍රමය සදහා වූ වරලත් ව්‍යාපාර | 3. IOC ඉන්ධන පිරවුම්හල් |

වරලත් ව්‍යාපාර වර්ග වලට අදාල නිදසුන් පිළිවෙළින් ගැලපූ විට නිවැරදි පිළිතුර වනුයේ

1. A-1 B-2 C-3
2. A-2 B-1 C-3
3. A-3 B-1 C-2
4. A-3 B-2 C-1
5. A-1 B-3 C-2 (.........)

06. ලෝකයේ ඕනෑම රටක් සමග සන්නිවේදනයේ දී දේශ සීමා මායිම් බැහැරව නිෂ්පාදන බෙදාහැරීම,

1. සමාජ ව්‍යවසායකත්වයයි.
2. හරිත ව්‍යවසායකත්වයයි.
3. ගෝලීය ව්‍යවසායකත්වයයි.
4. කාන්තා ව්‍යවසායකත්වයයි.
5. අභ්‍යන්තර ව්‍යවසායකත්වයයි. (.........)

07. සුළු හා මධ්‍යපරිමාණ ව්‍යාපාර වලට දිරිගැන්වීම් ලබාදෙන මූල්‍ය ආයතන කිහිපයක් පහත දැක්වේ,

A - සර්වෝදය
B - අපනයන සංවර්ධන මණ්ඩලය
C - සකසුරුවම් හා ණයදෙන සමිති
D - ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
E - කාර්මික සංවර්ධන මණ්ඩලය
F - ජපන් අන්තර්ජාතික සහයෝගීතා සංවිධානය
G - කාර්මික තාක්ෂණ ආයතනය

සුළු හා මධ්‍යපරිමාණ ව්‍යාපාර වලට දිරිගැන්වීම් ලබාදෙන රාජ්‍ය ආයතන පමණක් ඇතුලත් පිළිතුර වනුයේ,

1. A,B,C,D
2. B,C,D,E
3. D,E,F,G
4. A,C,E,F
5. B,D,E,G (.........)

08. වෙළඳ ආයතන විසින් ගනුදෙනුකරුවන්ට ලබා දී ඇති වෙළඳ ණය අය කිරීම සහ ණය මිළදී ගැනීම සිදු කරනු ලබන ආයතන හඳුන්වනුයේ,

1. ආයෝජන කළමනාකරුවන්
2. ආන්තික සැපයුම්කරුවන්
3. ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්
4. ප්‍රාරක්ෂකයින්
5. ඒකක භාර කළමනාකරණ සමාගම් (.........)

09. පහත දැක්වෙන්නේ විශේෂිත මූල්‍ය ආයතන වල කාර්යයන් කිහිපයකි,

A - භාණ්ඩාගාර සුරැකුම්පත් සම්බන්ධයෙන් ද්විතියික වෙළඳපොළේ ගනුදෙනු කිරීම
B - උකස් කටයුතු
C - තැන්පත් භාර ගැනීම සහ සාමාජිකයන්ට ණය සැපයීම
D - සමාගම් ලැයිස්තුගත කිරීමට අනුග්‍රහය සැපයීම
E - ආයෝජන ඉල්ලුම් පත්‍ර භාරගැනීම
F - ප්‍රචාරණ කටයුතු

ඉහත කාර්යයන් අතරින් පිළිවෙළින් ප්‍රාථමික අලෙවිකරුවන් හා සණස සමිති මගින් ඉටුකරන කාර්යයන් වන්නේ,

1. A හා E    2. B හා F    3. D හා E    4. B හා C    5. A හා C    (.........)

10. ප්‍රනාන්දු විසින් රු.මි: 50ක් වටිනා තම නෞකාව PQ රක්ෂණ සමාගමේ රක්ෂණය කල අතර එම රක්ෂණ සමාගම විසින් අදාල නෞකාව වෙනත් විදේශීය රක්ෂණ සමාගමක නැවත රක්ෂණය කළේය. මෙම රක්ෂණය හැඳින්වීමට උචිත පදය වන්නේ,

1. ද්විත්ව රක්ෂණය ලෙස ය .
2. විදේශීය රක්ෂණය ලෙස ය.
3. ප්‍රාරක්ෂණය ලෙස ය.
4. ප්‍රතිරක්ෂණය ලෙස ය.
5. අධිරක්ෂණය ලෙස ය. (.........)

11. විවිධ සන්නිවේදන මාධ්‍ය හා එම මාධ්‍ය මගින් සන්නිවේදනය සිදුවන ආකාර කිහිපයකි.

| මාධ්‍ය | ආකාර |
|---|---|
| A – වාචික බාහිර විද්‍යුත් | 1. ෆැක්ස් |
| | 2. හඬ තැපෑල |
| | 3. කෙටි පණිවුඩ සේවා |
| B - ලිඛිත බාහිර විද්‍යුත් | 4. ශබ්ද විකාශන යන්ත්‍ර |
| | 5. දුරකථන |
| | 6. ඊ මේල් |

ඉහත A හා B හි සඳහන් මාධ්‍යයන් තුනම මගින් සන්නිවේදනය සිදුවන ආකාරය නිවැරදිව දැක්වෙන පිළිතුර වනුයේ,

1. A – 2,4,5  B – 1,3,6
2. A – 1,2,3  B – 4,5,6
3. A – 2,4,3  B – 1,5,6
4. A – 3,4,5  B – 1,2,6
5. A – 2,3,6  B – 1,4,5 (.........)

12. ප්‍රවාහනය පුද්ගලයන්ට හා ආර්ථිකයට වැදගත් වන ආකාර පහත දැක්වේ.

A. සේවා නියුක්තිය වර්ධනය
B. රැකී රක්ෂා සහ සංචරණය සඳහා
C. විදේශ වෙළඳාම වර්ධනය
D. විනෝදාස්වාදය සඳහා
E. ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීම
F. අධ්‍යාපන කටයුතු සඳහා

ප්‍රවාහනය ආර්ථික වර්ධනයට වැදගත් වන ආකාරය දැක්වෙන නිවැරදි පිළිතුර වනුයේ,

1. A,B,C 2. B,C,D 3. C,D,E
4. D,E,F 5. A,C,E (.........)

13. ගබඩාවක තොග ගබඩාකරණ ක්‍රියාවලිය පහත දැක්වේ.

A. හඳුනා ගැනීම.
B. නිවැරදි බව තහවුරු කරගැනීම.
C. ගුණත්වය ආරක්ෂා කිරීම.
D. නැවත ලබා ගැනීම.
E. පරීක්ෂා කිරීම.
F. ඉවත් කිරීම
G. තොග ලැබීම.

ගබඩාකරණ ක්‍රියාවලිය අනුපිළිවෙලින් සඳහන් පිළිතුර වනුයේ,

1. A,B,C,D,E,F,G 2. G,A,E,B,C,F,D
3. G,E,A,C,B,F,D 4. D,A,B,C,E,F,G
5. A,G,E,C,B,F,D (.........)

22 A/L අපි [ papers gro

14. අන්තර්ජාතික වෙළඳාම හා සම්බන්ධ ලියවිලි පිළිබඳ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

A - නැව් සමාගම කරනු ලබන පොරොන්දු වීමකි.
B - ආනයනකරුගේ ඉල්ලීම මත ආනයනකරුගේ බැංකුව නිකුත් කරයි.
C - ආනයනකරු හෝ ඔහුගේ නියෝජිතයෙකු බැංකුවට ඉදිරිපත් කරයි.
D - භාණ්ඩ භාරගන්නා බව සඳහන් කරමින් රේගුව විසින් අපනයනකරුට නිකුත් කරයි.
E - පිළිගත් වෙළඳ මණ්ඩලයකින් නිකුත් කරයි.

ඉහත තොරතුරු හා අදාල වන ලියවිලි අනුපිළිවෙලින් දක්වන්න.

1. ප්‍රභවස්ථාන සහතිකය/ඇණවුම/නෞභාර පත/රක්ෂණ සහතිකය/හානි රක්ෂණ ලිපිය
2. නෞභාර පත/ණයවර ලිපිය/ආනයන සටහන්කරය/ වේදිකා කුවිතාන්සිය/ප්‍රභවස්ථාන සහතිකය
3. සනීපාරක්ෂක සහතිකය/නෞභාරපත/අපනයන සටහන් කරය/හානි රක්ෂණ ලිපිය/ඉන්වොයිසිය
4. ණයවර ලිපිය/නෞභාර පත/රක්ෂණ සහතිකය/අපනයන සටහන්කරය/ඇණවුම
5. සනීපාරක්ෂක සහතිකය/ණයවර ලිපිය/ප්‍රභවස්ථාන සහතිකය/රක්ෂණ සහතිකය/හානි රක්ෂණ ලිපිය

(.........)

15. e bay විද්‍යුත් වෙබ් අඩවිය හරහා සිදුවන ගනුදෙනු මූලිකවම අයත් වන්නේ පහත කුමන වර්ගීකරණයටද?

1. G2C 2. C2C 3. G2G 4. B2B 5. B2C

(.........)

16.

| කළමණාකරුගේ ප්‍රධාන භූමිකා | කළමණාකරුගේ උප භූමිකා |
|---|---|
| A. අන්තර් පුද්ගල භූමිකා<br>B. තොරතුරු භූමිකා<br>C. තීරණ භූමිකා | 1. නියාමකයෙකු ලෙස කටයුතු කිරීම<br>2. ව්‍යවසායකයෙකු ලෙස කටයුතු කිරීම<br>3. සම්පත් බෙදා හරින්නෙකු ලෙස කටයුතු කිරීම<br>4. ආයතනයේ ප්‍රධානියා ලෙස කටයුතු කිරීම<br>5. මාධ්‍ය ප්‍රකාශකයෙකු ලෙස කටයුතු කිරීම |

කළමණාකරුගේ ප්‍රධාන භූමිකා සමග උප භූමිකා ගැලපූ විට නිවැරදිව ගලපා ඇති පිළිතුර වන්නේ,

1. A – 3,4 / B – 5 / C – 1,2
2. A – 2,5 / B – 4 / C – 1,3
3. A – 3 / B – 1,2 / C – 4,5
4. A – 1,2 / B – 3,5 / C -4
5. A - 4 / B – 1,5 / C – 2,3

(.........)

17. පහත වගුවේ සංවිධාන ව්‍යුහයකින් නිරූපනය වන මූලධර්ම හා ඒවාට අදාළ විස්තර දක්වා ඇත.

| මූල ධර්ම | විස්තර |
|---|---|
| 1. අණ කිරීමේ ඒකීයතාව | A. එක් කළමණාකරුවෙකුට සෘජුව වාර්තා කරනු ලබන සහයකයන් සංඛ්‍යාවයි. |
| 2. පාලන විතස්තිය | B. ආයතනයක තීරණ ගැනීමේ සියලු බලතල ඉහළ කළමණාකරණය මත කේන්ද්‍ර ගත වීමයි. |
| 3. අණ කිරීමේ දාමය | C. එක් සේවකයෙකු එක් සුපරීක්ෂකයෙකුට පමණක් වගකිව යුතුය යන්න දක්වයි. |
| 4. මධ්‍යගතකරණය | D. සංවිධානයේ ඉහළ කළමනාකාරීත්වයේ සිට පහළ කළමණාකරණය තෙක් නොකැඩුනු අධිකාරී මාර්ගයයි. |

ඉහත දී ඇති මූල ධර්ම අනුපිළිවෙල අනුව විස්තර නිවැරදිව ගලපා ඇති වරණය කුමක්ද?

1. D,A,C,B
2. C,A,D,B
3. B,C,D,A
4. D,B,C,A
5. C,B,A,D

(.........)

18. පහත දැක්වෙන්නේ කළමණාකරණ පාලන ක්‍රියාවලියේ විවිධ අදියර ය.

A – ප්‍රතිකර්මීය ක්‍රියා මාර්ග ගැනීම.
C – ප්‍රමිති ස්ථාපිත කිරීම.
B – කාර්යඵල මැනීම.
D – විචලන හඳුනා ගැනීම.

කළමනාකරණ පාලන ක්‍රියාවලිය නිවැරදිව පෙළ ගස්වා ඇති වරණය තෝරන්න

1 D,C,B,A
2 C,B,A,D
3 D,B,C,A
4 C,B,D,A
5 B,D,C,A

(.........)

19. පහත වගුවේ කම්හල් පිරියත සැලසුම් වර්ග හා ඒවා වඩාත් යෝග්‍ය ව්‍යාපාර ආයතන වර්ග කිහිපයක් දක්වා ඇත.

| පිරියත සැලසුම් වර්ග | ව්‍යාපාර ආයතන වර්ග |
|---|---|
| 1. නිෂ්පාදිත පිරියත | A. ඇගලුම් කර්මාන්ත ශාලා |
| 2. කුටි පිරියත | B. ගෘහ භාණ්ඩ නිෂ්පාදන ආයතන |
| 3. ස්ථාවර ස්ථානීය පිරියත | C. මෝටර් රථ නිෂ්පාදන ආයතන |
| 4. ක්‍රියාවලි පිරියත | D .ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු |

ඉහත දී ඇති පිරියත සැලසුම් ක්‍රම අනුපිළිවෙළ අනුව ඒවාට වඩාත් යෝග්‍ය ව්‍යාපාර ආයතන නිවැරදිව ගලපා ඇති වරණය කුමක්ද?

1. B,A,D,C
2. C,B,D,A
3. C,A,D,B
4. B,D,A,C
5. B,D,C,A

(.........)

22 A/L අපි [ papers group ]



20. උපරිම තොග මට්ටම ගණනය කිරීම සඳහා අවශ්‍ය නොවන්නේ මින් කුමක්ද?
1. ඇණවුම් කිරීමේ පිරිවැය
2. අවම තොග භාවිතය
3. අවම ඇණවුම් කාලය
4. යළි ඇණවුම් ප්‍රමාණය
5. යළි ඇණවුම් මට්ටම (.........)

21. තත්ත්ව පාලනය සම්බන්ධයෙන් සත්‍ය නොවන ප්‍රකාශය මින් කුමක්ද?
1. දෝෂ සිදුවීම නිෂ්පාදනයේ මුල් අවස්ථාවේම වළක්වා ගැනීමට උත්සහ කිරීම.
2. පූර්ව නිශ්චිත ප්‍රමිතිය අනුව නිෂ්පාදිත සිදු වන බව සහතික කර ගැනීම.
3. දෝෂ ශුන්‍ය මට්ටමට ළඟා වන පරිදි නිෂ්පාදනය සිදු කිරීම.
4. නිමි භාණ්ඩ පමණක් පරීක්ෂාවට භාජනය කිරීම.
5. සම්පත් නාස්තිය අවම කර ගැනීමට කටයුතු කිරීම. (.........)

22. "අලෙවිකරණ මිශ්‍රයේ සියලුම විචල්‍යයන් (4Ps) ඉලක්ක ගනුදෙනුකරුවන් තෘප්තිමත් කිරීම අරමුණු කරගෙන ක්‍රියාත්මක වේ" මෙම අදහස ඉදිරිපත් කරන සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය, වන්නේ,
1. සම්බන්ධතා අලෙවිකරණය
2. අභ්‍යන්තර අලෙවිකරණය
3. සමෝධානිත අලෙවිකරණය
4. කාර්ය සාධන අලෙවිකරණය
5. සමාජීය අලෙවිකරණය (.........)

23. නිෂ්පාදකයා විසින් නිෂ්පාදිත, වෙළඳුන්ට අලෙවි කළ පසු වෙළඳුන් විසින් එම නිෂ්පාදිත සඳහා නිෂ්පාදනය කර ගන්නා සන්නම හඳුන්වන්නේ,
1. පවුල් සන්නම ලෙස ය.
2. භාණ්ඩ සන්නම ලෙස ය.
3. ජාතික සන්නම ලෙස ය.
4. පෞද්ගලික සන්නම ලෙස ය.
5. පාරිභෝගික සන්නම ලෙස ය. (.........)

24. පහත සඳහන් වෙළඳ පොළවල් අතුරින් මුදල් වෙළඳපොළට සම්බන්ධ නොවන වෙළෙඳපොළ තෝරන්න.
1. අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළඳපොළ
2. දේශීය විදේශීය විනිමය වෙළඳපොළ
3. භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ
4. භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ
5. වාණිජ පත්‍රිකා වෙළඳපොළ (.........)

25. පහත සඳහන් මූල්‍ය සම්පාදන මාර්ග අතුරින් බාහිර මෙන්ම චක්‍ර යන දෙවර්ගය යටතට ගැනෙන මූල්‍ය සම්පාදන මාර්ග ඇතුළත් කාණ්ඩය තෝරන්න.
1. බැංකු ණය/කල් බදු/අතිරික්ත වත්කම් විකිණීම
2. කුලී පිට ගැනුම්/රඳවා ගත් ලාභ/ක්ෂය වෙන් කිරීම්
3. කල් බදු/බැංකු ණය/බැංකු අයිරා
4. සාධ්‍යකරණය/කුලීපිට ගැනුම්/රඳවා ගත් ලාභ
5. ක්ෂය වෙන් කිරීම/වාණිජ පත්‍රිකා/ණයකර නිකුතුව (.........)

26. සංචේතන පද්ධතියක මූලිකාංග ඇතුලත් කාණ්ඩය වන්නේ,

1. පුහුණුව, සංවර්ධනය හා දිරි දීමනා ය.
2. උසස් වීම්, වැටුප් වැඩි වීම් හා අනෙකුත් ප්‍රතිලාභ ය.
3. වේතන, දිරි දීමනා හා අනෙකුත් ප්‍රතිලාභ ය.
4. වේතන, කාර්ය සාධනය හා පුහුණුව ය.
5. දැනුම, වැඩ සටහන් හා දිරි දීමනා ය. (.........)

27. වැඩ වර්ජන නිසා ආර්ථිකයට වන අහිතකර බලපෑමක් වන්නේ,

1. නිෂ්පාදන අඩාල වීම ය.
2. භාණ්ඩ හා සේවා වල මිල ගණන් ඉහළ යාම ය.
3. කාර්මික සම්බන්ධතා අඩු වීම ය.
4. ශ්‍රම පිරිවැටුම අඩු වීම ය.
5. වෘත්තීය ක්ෂේත්‍රයේ අප්‍රසාදයට ලක් වීම ය. (.........)

28. භාවිතය අනුව තොරතුරු පද්ධති වර්ග සහ ඒවාට අදාළ නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

| තොරතුරු පද්ධති | නිදසුන් |
|---|---|
| A. කාර්යාල ස්වයංකරණ පද්ධති (OAS) | 1. මෝස්තරකරණය |
| B. දැනුම් කාර්ය පද්ධති (KWS) | 2. විද්‍යුත් තැපෑල |
| C. ගනුදෙනු සැකසුම් පද්ධති (TPS) | 3. දෛනික විකුණුම් වාර්තා |
| D. කළමණාකරණ තොරතුරු පද්ධති (MIS) | 4. ද්‍රව්‍ය |

ඉහත සඳහන් තොරතුරු පද්ධති වලට අදාල නිදසුන් පිළිවෙලින් ගැලපූ විට නිවැරදි පිළිතුර වනුයේ

1. A-1/B-2/C-4/D-3
2. A-4/B-3/C-2/D-1
3. A-2/B-1/C-4/D-3
4. A-3/B-2/C-4/D-1
5. A-1/B-4/C-3/D-2 (.........)

29. ව්‍යාපාරයේ සමස්ථ සැලැස්ම පිළිබඳ දළ අවබෝධයක් ලබා ගත හැකි වන්නේ,

1. ව්‍යාපාරයේ මෙහෙයුම් සැලැස්ම අධ්‍යයනයෙනි.
2. ව්‍යාපාර විස්තරය අධ්‍යයනයෙනි.
3. ව්‍යාපාර මූල්‍ය සැලැස්ම අධ්‍යයනයෙනි.
4. ව්‍යාපාරයේ විධායක සාරාංශය අධ්‍යයනයෙනි.
5. ව්‍යාපාර සැලැස්මේ මුල් පිටුව අධ්‍යයනයෙනි. (.........)

30. මූල්‍ය සැලැස්මක අන්තර්ගත කරුණුවලට අදාළ උප කොටස නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

1. ඇස්තමේන්තු ගත ව්‍යාපෘති පිරිවැය තුල විකුණුම් පිරිවැය අන්තර් ගත වේ.
2. ඇස්තමේන්තු ගත ආදායම් ප්‍රකාශය තුල මුළු කාරක ප්‍රාග්ධනය අන්තර් ගත වේ.
3. ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල ජංගම වත්කම් අන්තර් ගත වේ.
4. ඇස්තමේන්තු ගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල මුදල් ගලා ඒම් අන්තර් ගත වේ.
5. ණය ආපසු ගෙවීමේ සටහන තුල ව්‍යාපෘති සාරාංශය අන්තර් ගත වේ. (.........)

22 A/L අපි [ papers group ]


31. අ. ....................................................... ව්‍යාපාර විකාශනයේ පළමු අදියර වන අතර, ....................................................... එහි වර්තමාන අදියර වේ.

ආ. ව්‍යාපාරයක සැපයුම්කරුවෝ ....................................................... පරිසර බලවේගයක් වන අතර, සේවකයෝ ....................................................... පරිසර බලවේගයකි.

32. අ. රටක මිල මට්ටම ස්ථාවරව පවත්වා ගැනීම, ....................................... හා ....................................... පාලනය කිරීම අභ්‍යන්තර මිල ස්ථායීතාව තුළින් සිදු කෙරේ.

ආ. රටක මුදල් සැපයුම පාලනය සඳහා ....................................... ක්‍රියාක්මක කරනු ලබන අතර, එය ....................................... විසින් ක්‍රියාත්මක කරයි.

33. අ. සමූපකාර සමිතියක් වයස අවුරුදු 18ට වැඩි ඕනෑම පුද්ගලයන් ....................................... එකතු වී රු. ....................................... සාමාජික මුදලින් ඇරඹිය හැක.

ආ. හිමිකාරීත්වය අනුව රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය ලෙස ව්‍යාපාර වර්ග කෙරේ. ඛණිජ තෙල් බෙදා හැරීම සිදු කරන රාජ්‍ය අංශයේ ව්‍යාපාරය ....................................... වන අතර, පෞද්ගලික අංශයේ ව්‍යාපාරය ....................................... වේ.

34. අ. ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පළමු පියවර ....................................... වන අතර, අවසාන පියවර ....................................... වේ.

ආ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට විදේශ වෙළෙඳපොළ පහසුකම් සපයා දීම ....................................... විසින් සිදු කරන අතර, විශිෂ්ඨතා සම්මාන ලබා දීම ....................................... විසින් සිදු කරයි.

35. අ. වාණිජ බැංකුවක ....................................... ගිණුමේ පවතින මුදල් ශේෂය සඳහා පොළියක් නොගෙවන අතර රජය විසින් මෑතකදී නැවත ....................................... සඳහා ගෙවන පොළිය ඉහළ දමන ලදී.

ආ. රක්ෂණ ගිවිසුමට ප්‍රධාන පාර්ශව දෙකක් සම්බන්ධ වන අතර, ඒ අතරින් ....................................... වාරික ගෙවීමත්, රක්ෂණ උපද්‍රව හේතුවෙන් සිදුවූ අලාභ සඳහා ....................................... විසින් වන්දි ගෙවීමත් සිදු කරයි.

36. අ. සන්නිවේදන ක්‍රියාවලියේදී පණිවුඩය ලබන්නා විසින් අදාළ පණිවුඩය පිළිබඳ ක්‍රියා කරන ආකාරය ....................................... ලෙස හඳුන්වන අතර, පණිවුඩය ලැබුණු බව, එය තේරුම්ගත් බව තහවුරු කරමින් පණිවුඩය ලබන්නාගෙන් පණිවුඩය යවන්නාට ලැබෙන ප්‍රතිචාරය ....................................... ලෙස හැඳින්වේ.

ආ. ශ්‍රී ලංකාවට මූල්‍ය ආධාර සපයා ගැනීම සඳහා මෑතකදී අප රටේ මූල්‍ය හා දේශපාලන අධිකාරියේ අවධානය යොමු වී ඇති ජාත්‍යන්තර සංවිධාන දෙක වන්නේ ....................................... හා ....................................... ය.

37\. අ. ආයතනයක සමස්ථ කාර්යයන් සරල කොටස් වලට වෙන් කිරීම.............................................. වන අතර, ආයතනයක කාර්යවල දැකිය හැකි පොදු ලක්ෂණ උපයෝගී කරගෙන රැකියා කාණ්ඩගත කිරීමේ ක්‍රියාවලිය.............................................ලෙස හැඳින්වේ.

ආ. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර වල මූලික වශයෙන් නිෂ්පාදනය කරනු ලබන්නේ............................... භාණ්ඩ වේ. සම්පත් උපයෝගී කරගෙන ඉහළ ගුණත්වයෙන් යුත් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම ........................................................... මූලික කාර්යය වේ.

38\. අ. තොග පවත්වාගෙන යාමේ හා ඇණවුම් කිරීමේ පිරිවැය අවම වන පරිදි එක් ඇණවුමකට ඇතුලත් කළයුතු ඒකක සංඛ්‍යාව ........................................................ ලෙස හැඳින්වෙන අතර, මෙම ද්‍රව්‍ය ඇණවුම් කළ අවස්ථාවේ සිට ගබඩාවට ලැබීමට ගතවන කාලය ........................................... වේ.

ආ. ව්‍යාපාරිකයාගේ දෘෂ්ඨියෙන් අලෙවිකරණ මිශ්‍රයට මිනිසුන්,........................................................ හා ............................................ යන සේවා සඳහා වූ විචලනයන් තුනක් ඇතුළත් වේ.

39\. අ. තම සේවක ඉල්ලීම දිනා ගැනීම සඳහා වෘත්තීය සමිතියක සාමාජිකයන් දිනක් හෝ වරුවක් රාජකාරියෙන් බැහැරව වී සිටීම.............................................වන අතර, තම ඉල්ලීම් විරෝධතා පෑම මගින් දිනා ගැනීමට නොහැකි වූ විට ඉල්ලීම් ලැබෙන තුරු වැඩ කිරීම සම්පූර්ණයෙන් නතර කිරීම ........................................................ වේ.

ආ. ලැයිස්තුගත සමාගමක් විසින් නිකුත් කර ඇති කොටස්වල වෙළඳපොළ අගය, සමාගමේ ........................................... ලෙස හැඳින්වෙන අතර, මෙය.................................................... මිල දර්ශකය සකස් කිරීමේදී අදාළ කරගනී.

40\. අ. අග්‍ර මට්ටමේ කළමණාකරුවන්ට................................................................... තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු ලබා දීමට සැකසුනු තොරතුරු පද්ධති................................................... වේ.

ආ. පුද්ගලයෙකුගේ හෝ සංවිධානයක අවශ්‍යතාවක් හෝ උවමනාවක් ඉටුකළ හැකි නිෂ්පාදිතයක් පිළිබඳ ව්‍යවසායකයෙකු තුළ ඇති වන සිතුවිල්ල..........................................................................වේ. මෙය සාර්ව හා සූක්ෂම විශ්ලේෂණයකට භාජනය කිරීම මගින් ....................................................... තීරණය කළ යුතු ය.

✹ අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **නිශ්චිත පිළිතුරු** සපයන්න.

41\. භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් දෙක බැගින් දක්වන්න

| භාණ්ඩ | සේවා |
|---|---|
| 1. ...................................................... | 1. ...................................................... |
| 2. ...................................................... | 2. ...................................................... |

22 A/L අපි [ papers group ]

42. ව්‍යාපාරයකට ආර්ථික තිරසර බව තහවුරු කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග හතරක් ලියන්න.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

43. සමූපකාර ප්‍රතිපත්ති හතරක් ලියන්න.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

44. ගිවිසුම්ගත ඉතිරිකිරීමේ ආයතන හතරක් සඳහන් කරන්න.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

22 A/L අපි [ papers group ]

45. ආනයන හා අපනයන වෙළඳාමේදී භාවිත වන ලියවිලි හතරක් සඳහන් කරන්න.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

46. තත්ත්ව පාලනය සඳහා භාවිත කළහැකි ශිල්පීය ක්‍රම හතරක් ලියන්න.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

47. කොටස් වෙළඳපොලේ ගනුදෙනු වන සුරැකුම්පත් මිලදී ගැනීමෙන් අත්වන ඍජු ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

48. සාමූහික ගිවිසුමක් මගින් සේවකයාට හිමිවන ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න.

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

49. අභ්‍යන්තර සේවක ආකර්ෂණයේ වාසි හතරක් සඳහන් කරන්න.


........................................................................................................................


........................................................................................................................

........................................................................................................................


........................................................................................................................

50. පහත සංකේත වලින් අදහස් වන දේ ඉදිරියෙන් ලියන්න.

1.  ........................................

2.  ........................................

3.  ........................................

4.  ........................................

22 A/L අපි [ papers group ]